# තනතුරු - ඇබෑර්තු

## දඹුල්ල ප්‍රාදේශීය සභාව

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර , බැකෝ ලෝඩර් ක්‍රියාකරු තනතුර සහ මෝටර් ග්‍රේඩර් ක්‍රියාකරු තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **අධ්‍යාපන සුදුසුකම් -:** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය.

02. **වෘත්තීය සුදුසුකම් :-** මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුර සඳහා අදාලවන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.

- **බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර / බැකෝ ලෝඩර් ක්‍රියාකරු තනතුර / මෝටර් ග්‍රේඩර් ක්‍රියාකරු තනතුර- සම්පූර්ණ කළ යුතු සුදුසුකම් :-**

  තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද "ඒ" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ජේ" පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම) හා

  ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදාළ වන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් (NAITA/ ICTAD) පුහුණුව ලැබූ බවට (NVQ 4 මට්ටමට නොඅඩු) සනාථ කරන සහතිකය

03. **පළපුරුද්ද :-** මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

04. **බඳවා ගැනීමේ කොන්දේසි සහ පොදු සුදුසුකම් :-**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

iii. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ දිවා/රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු අතර මධ්‍යම පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය. අවම උස අඩි 05 අඟල් 02 ½ ක් විය යුතුය.

iv. මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

v. දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීමට වසමේ ග්‍රාම නිලධාරිගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඩුවම් ලැබූවෙකු නොවිය යුතු අතර රජයේ/ පළාත් රාජ්‍යය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

vii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

viii. මෙම බඳවා ගැනීම තාවකාලිකය. අදාළ තනතුර සඳහා වන ගෙවීම් සභාව විසින් අනුමත කරන ලද දෛනික වැටුපකට යටත් වේ.

ix. මෙම තාවකාලික පත්කිරීම දඹුල්ල ප්‍රාදේශීය සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් නොවේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :-

**විවෘත බඳවා ගැනීම :-**

1. අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලුම දෙනා ලිඛිත පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

2. ලිඛිත පරීක්ෂණයට ඉදිරිපත් වී ඉහළ ලකුණු ලැබූ අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කර එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරා ගෙන බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**සීමිත බඳවා ගැනීම :-** ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉන් සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.

06. **අයදුම් කළ යුතු ආකාරය :-**

- මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් සකස් කර, අයදුම්පත් 2026.04.20 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, දඹුල්ල ප්‍රාදේශීය සභාව, සීගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.
- අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය;
ii. අධ්‍යාපන සහතික;
iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්;
iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්. ( එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය);
v. වෘත්තිය පිළිබඳ සහතික;
vi. සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.).

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල දඹුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.